Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

7 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2022(2023) | **86 S**

නම: ............................................ | **බුද්ධ ධර්මය** | **කාලය පැය දෙකයි**

**I කොටස**

- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 02 බැගින් ලකුණු 40 ක් හිමි වේ.**
- **දෙවන කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න වලින් 04 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

**01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

01. මහා සුළඟක් සමග වර්ෂාවක් ඇති වීම සහ එම වර්ෂාවෙන් බුදු රදුන් ආරක්ෂා කිරීමට මුචලින්ද නා රජු ඉදිරිපත් වූයේ,
(i) දෙවන සතියේ දීය. (ii) තෙවන සතියේ දීය. (iii) පස් වන සතියේ දීය. (iv) හය වන සතියේ දීය.

02. බුදුන් හා දහම් සරණ ගිය පළමු (දෙවාචික) උපාසකවරුන් ලෙස හැඳින්වෙන්නේ ...................... දෙදෙනාය.
(i) තපස්සු, භල්ලුක (ii) උපතිස්ස, කෝලිත
(iii) නදී හා ගයා කාශ්‍යප (iv) ආලාරකාලාම උද්දකරාමපුත්ත

03. නව අරහාදී බුදුගුණ සඳහන් කරමින් රචනා කර ඇති කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?
(i) කාව්‍ය ශේඛරය (ii) බුදුගුණ අලංකාරය (iii) ලෝවැඩ සඟරාව (iv) සුභාෂිතය

04. කරණීයමෙත්ත සූත්‍රයේ සඳහන් නිවන් පතන මෙත් වඩන්නෙකු තුල තිබිය යුතු ගුණාංග ගණන වන්නේ,
(i) 11 කි. (ii) 12 කි. (iii) 15 කි. (iv) 10 කි.

05. බුදු සසුනේ අග්‍ර දායිකයා හා දායිකාව වන්නේ,
(i) බිම්බිසාර රජු හා විශාඛාවයි. (ii) අනේපිඬු සිටු හා විශාඛාවයි.
(iii) අනේපිඬු සිටු හා ප්‍රජාපතී ගෝතමියයි. (iv) බිම්බිසාර රජු හා ප්‍රජාපතී ගෝතමියයි.

**06 - 10 දක්වා ප්‍රශ්න හොඳින් කියවා නිවැරදි නම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් ( ✗ ) ලකුණ ද යොදන්න.**

06. සිරිත් මල්දම කෘතිය රචනා කරන ලද්දේ වීදාගම මෛත්‍රී හිමියන් ය. ( )

07. බිම්බිසාර රජුට තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනා කරන ලදී. ( )

08. ධනංජය සිටුතුමාගේ හා සුමනා දේවියගේ දියණිය විශාඛාවයි. ( )

09. ධම්ම පදය අයත් වන්නේ විනය පිටකයට ය. ( )

10. ගිහියාගේ නිත්‍ය සීලය වන්නේ පංච ශීලයය යි. ( )

**11 - 15 දක්වා ප්‍රශ්න හොඳින් කියවා නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.**

11. ගුරු සිසු සබඳතාවය පෙන්නුම් කරන්නේ ...............................දියාවෙනි.

12. බෝසතාණන් වහන්සේගේ චරිතය තුළින් නායකත්ව ගුනාංග පෙන්නුම් කරන්නේ ........................... ජාතකයෙනි.

13. සීල සමාධි ප්‍රඥා යනු ........................................ වයි.

14. කුඹුරු වලින් ලබා ගන්නා අස්වැන්නේ පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීම ..................................... දානයයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

15. බුදුන් වහන්සේ .............................................. සූත්‍රයේ දී රෝග හට ගන්නා ක්‍රම 08 ක් දේශනා කරන ලදී

(ගිරිමානන්ද/දකුණු/ අග්‍රශෂ්‍ය/ ත්‍රිශික්ෂා/අපණ්ණක)

**16 -20 දක්වා වූ ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා යා කරන්න.**

| | |
|---|---|
| 16. පූර්වාරාමය ඉදි කළේ | A. වේළුද්වාර සූත්‍රය |
| 17. මිහිඳු හිමිගේ ලංකාගමනය | B. දම්සක් පැවතුම් සූත්‍රය |
| 18. අත්තූපනායික ධර්ම | C. අටලෝ දහම |
| 19. ඉසිපතනයේ මිගදාය | D. මහින්දාගමනය |
| 20. ලාභ අලාභ යස අයස නින්දා ප්‍රශංසා සැප දුක් | E. විශාඛා සිටු දේවිය |

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

01. (i) තුන් කල්හිම පැවති - පදරුත් සියල් ලොව ඇති
.................................. - .................................. මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න
(ii) බුදුරජාණන් වහන්සේ අසරණයන්ට පිහිට වූ අවස්ථා 02ක් ලියන්න.
(iii) තෙරුවන් නම් කරන්න.
(iv) ධනංජය සිටු තුමා තම දියණියට යුග දිවිය සාර්ථක කර ගැනීමට ලබා දුන් උපදෙස් ගණන කීයද?
(v) භාවනාවට සුදානම් වන්නකු වාඩිවන ඉරියව් 02 නම් කරන්න.
(vi) ධම්ම පදය අයත් වන්නේ සූත්‍ර පිටකයේ කුමන නිකායටද?
(vii) පාසලේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත් 02ක් ලියන්න.
(viii) අපණ්ණක ජාතකයේන් ගත හැකි නායකත්ව ගුණාංග 02ක් ලියන්න.
(ix) නියාම ධර්ම අතරින් 02ක් ලියන්න.
(x) තණ්හාවේ ප්‍රභේද 02කි. ඉන් 02ක් ලියන්න, (10x2=20)

02. (i) බුදු රජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය ප්‍රකට වන අවස්ථා 02ක් නම් කරන්න.
(ii) ඉන් එක් අවස්ථාවක් කෙටියෙන් ලියන්න.
(iii) උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග 05 ක් ලියන්න, (2+3+5=10)

03. (i) වෛරය නොසන්සිඳෙන අයුරු කියවෙන ධම්ම පද ගාථාව අක්කොච්චිමං අවධිමං " යන ගථාව සම්පූර්ණ කරන්න.
(ii) එම ගාථාවේ තේරුම ලියන්න.
(iii) වෛර නොකර මෛත්‍රී සහගතව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 05ක් ලියන්න. (2+3+5=10)

04. (i) චතුරාර්ය සත්‍ය අතරින් 02ක් ලියන්න.
(ii) කාමසුඛල්ලිකානු යෝගය හා අත්තකිලමතනානුයෝගය කෙටියෙන් හඳුන්වන්න.
(iii) චතුරාර්ය සත්‍ය ඉගෙනීමෙන් ප්‍රායෝගික ජීවිතයේදී අපට ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න

05. (i) පංච ශීලයට අයත් සිල් පද 02ක් නම් කරන්න
(ii) ඉන් එක් සිල්පදයක් කෙටියෙන් විස්තර කරන්න.
(iii) කය වචනය සංවර කර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන 05ක් ලියන්න. (2+3+5-10)

06. (i) මහින්දාගමනය සිදු වූයේ කවර පොහෝ දිනකද?
(ii) මිහිඳු හිමි සමග ලංකාවට සපැමිණි පිරිවර නම් කරන්න.
(iii) මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකිකයන් ලත් දායාදයන් 05 ක් කෙටියෙන් නම් කරන්න.

07. පහත මාතෘකා වලින් 02ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(i) සමජීවිකථා (ii) විශාඛා සිටුදේවිය. (iii) සිරිත් විරිත් (iv). අනේ පිඬු සිටු තුමා
(5+5=10)